## පෙරවදන

පලාත් පාලනය තුල දැනට පවතින එකම නෛතික පරිපාලන මෙවලම වශයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණත ඉතා වැදගත් වේ. මෙම පණත මගින් හා ඒ සඳහා මෑතදී එක් කල 2013 අංක 21 දරණ (විශේෂ ප්‍රතිපාදන) සංශෝධනය ඇතුළු සියළු සංශෝධන මඟින් ද ආවරණය වන්නේ සමස්තයක් වශයෙන් සියළුම ප්‍රදේශිය සභාවලට පොදු හා විශේෂිත අවශ්‍යතාවයන්ය. එහෙත් මෙම ප්‍රාදේශීය සභාවල ප්‍රාදේශීය ස්වරූපය සලකා බලන විට ප්‍රස්තුත වී ඇති පොදු අවශ්‍යතා දැඩි ලෙස වෙනස්කම්වලට ලක්වේ. මෙම වෙනස්කම්වල ඇති ප්‍රවනතා ප්‍රාදේශීය වශයෙන් පවතින වෙනස්කම් මත තීරණය වන බැවින් ඒ පිළිබඳව සුවිශේෂි අවධානයක් යොමු කිරීමට සිදු වී ඇත. විශේෂයෙන්ම උතුරු පලාතේ දශක 3 ක කාලයක් තිස්සේ අඛණ්ඩව පැවතුණු යුද්ධයත් සමගින් එතෙක් පැවති භෞතික සැලසුම් ව්‍යුහයන් හා විවිධ නියමයන් සහමුලින්ම විනාශ වී හා වැලලී ගොස් ඇත.

යුද්ධය අවසාන වීම හා ඒ සමගින් ඇතිවූ පශ්චාත් යුධමය සැලසුම් තුලින් මේ වන විට උතුරු පලාත පුළුල් වෙනස්කම් ක්‍රියාවලියකට යොමු වී ඇත. ඒ සමඟින් පොදු අවශ්‍යතාවල පසුබිම් ව්‍යුහයන් හා ප්‍රාදේශීය ස්වරූප විශාල වශයෙන් වෙනස් වෙමින් පවතී.

මේ තත්වයන් සලකා බලන විට, පළාත් පාලන ආයතන වලට පැවරි ඇති කාර්ය හා අනෙකුත් ප්‍රජා සේවා අවශ්‍යතා විධිමත් කිරීම, පරිපාලනය හා පාලනය උදෙසා පලාත් පාලන අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවක් බැව් නිරීක්ෂණය වී ඇත. එබැවින් පලාත්පාලන ආයතනවල නෛතික පසුබිම ගොඩනගා ගැනීම උදෙසා අතුරු නීති සම්පාදනයට අත් වැලක් ලෙස මෙම ආදර්ශ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර ඉදිරිපත් කරනු ලැබේ.

මෙම අතුරු ව්‍යවස්ථා කෙටුම්පත්කරණය සඳහා අනුපමේය සේවයක් සැලසූ හිටපු පළාත් පාලන සහකාර කොමසාරිස් (ජ්‍යෙෂ්ඨ උපදේශක නීති හා පළාත් පාලන) එච්.ජී.සී. ජයතිස්ස මහතාට, මේ සඳහා පාදක තොරතුරු ලබා දීමට නන් අයුරින් සහයෝගය දුන් වවුනියාව, මන්නාරම, කිලිනොච්චිය හා යාපනය දිස්ත්‍රික්කවලින් අප හා සම්බන්ධ වූ ප්‍රාදේශීය සභාවල ගරු සභාපතිතුමන්ලාට හා ගරු මන්ත්‍රීතුමන්ලාට, ගරු ලේකම් වරුන් හා මාගේ සහෝදර කාර්ය මණ්ඩලයට දවිශේෂ ස්තූතිය පිරිනැමේ.

ශ්‍රියානි විජේසුන්දර
අංශ ප්‍රධානි- යහපාලන වැඩ සටහන

## පටුන


| | | | |
|---|---|---|---|
| I | වන කොටස | - | සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළ අර්ථ නිරූපණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| II | වන කොටස | - | සියළුම සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළ පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| III | වන කොටස | - | අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| I V | වන කොටස | - | ප්‍රාදේශීය සභා සීමාව තුල පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම පිළිබද අතුරු ව්‍යවස්ථා |
| V | වන කොටස | - | කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| VI | වන කොටස | - | මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| VII | වන කොටස | - | මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| VIII | වන කොටස | - | කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන් හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| IX | වන කොටස | - | බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| X | වන කොටස | - | බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XI | වන කොටස | - | හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XII | වන කොටස | - | නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XIII | වන කොටස | - | සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XIV | වන කොටස | - | වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XV | වන කොටස | - | පොදු වෙළෙඳ පොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XV1 | වන කොටස | - | ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XVII | වන කොටස | - | වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| XVIII | වන කොටස | - | ප්‍රාදේශීය සභා සීමාව තුල මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබද අතුරු ව්‍යවස්ථාව |
| XIX | වන කොටස | - | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල අතුරු ව්‍යවස්ථා |
| X | වන කොටස | - | පෞද්ගලික ඉඩම් කටු පඳුරුවලින් තොරව පවත්වා ගැනීම, විධිමත් කිරීම,හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා |

## ප්‍රාදේශීය සභාවලට අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ හැකි විෂය ක්ෂේත්‍ර හා කාරණා

### ප්‍රාදේශීය සභා පනතේ 69 සහ 126 වන වගන්ති

ප්‍රාදේශීය සභාවලට අතුරු ව්‍යවස්ථා සෑදීම සඳහා බලය ලැබී ඇති ප්‍රධාන විෂය කෂේත්‍රය හෝ කාරණය පහත වගුවේ දෙවන තීරුවේ සඳහන් කර ඇති අතර එකී ප්‍රධාන විෂය කෂේත්‍රය යටතේ විශේෂයෙන් සඳහන් කර ඇති අතිරේක කාරණා සංඛ්‍යාව තුන්වන තීරුවේ ද දැක්වේ. ප්‍රධාන විෂය කෂේත්‍රය ඇතුළත් වන 69 වන වගන්තියේ හෝ 126 වන වගන්තියේ අදාළ උපවගන්තියට යොමුව හතරවන තීරුවේ ද සඳහන් කර ඇත.

| | ප්‍රධාන කෂේත්‍රය හෝ කාරණය | අතිරේක කාරණා ගණන | 69 වගන්තියේ උපවගන්තිය |
|---|---|---|---|
| 1 | යම් ගිවිසුමක කාර්යය හෝ මහජන සේවාවන් සම්බන්ධයෙන් අයිතිවාසිකම් හා බැඳීම් සහතික කිරීම | 08 | 1* |

| | ප්‍රධාන කෂේත්‍රය හෝ කාරණය | අතිරේක කාරණා ගණන | 126 වගන්තියේ උපවගන්තිය |
|---|---|---|---|
| 1 | රැස්වීම් සහ කාර්ය පටිපාටිය | 04 | (i) |
| 2 | නිලධරයන් සහ සේවකයන් | 07 | (ii) |
| 3 | වෙන කිසිම ප්‍රකාශිත විධිවිධානයක් සලසා නොමැත්තා වූ ද, මේ පනත යටතේ ගෙවිය යුතු වූ ද, යම් බදු අයකර ගැනීම සහ එබඳු යම් බදුවල කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි සියලුම වාර වාර්තා සහ තොරතුරු සැපයීම ද ඇතුළුව බදු අයකර ගැනීම | 01 | (iii) |
| 4 | ණය | 04 | (iv) |
| 5 | වරිපනම් බදු සහ ගාස්තු පැනවීම, අයකර ගැනීම සහ ලබා ගැනීම | 05 | (v) |
| 6 | ඉඩම් සහ දේපළ | 06 | (vi) |
| 7 | පාරවල් සහ මංමාවත් | 08 | (vii) |
| 8 | ගොඩනැගිලි, ගොඩනැගිලි තැනීම සහ වැඩ කටයුතු | 08 | (viii) |
| 9 | මහජන සෞඛ්‍ය සහ සැප විහරණ ක්‍රම | 21 | (ix) |
| 10 | සංචාරක වෙළෙන්දන් | 04 | (x) |

| | ප්‍රධාන ක්ෂේත්‍රය හෝ කාරණය | අතිරේක කාරණා ගණන | 126 වගන්තියේ උපවගන්තිය |
|---|---|---|---|
| 11 | සතුන් | 11 | (xi) |
| 12 | පොදු හෝ පෞද්ගලික වෙළෙඳ පොළවල් සහ පොළවල් | 17 | (xii) |
| 13 | ජල සම්පාදනය සහ ජල කර්මාන්ත | 12 | (xiii) |
| 14 | පොදු සේවාවන් පිහිටුවීම, නඩත්තු කිරීම, ක්‍රියා කරවීම | 01 | (xiv) |
| 15 | පාන්වල මිම් හෝ දිග පළල සහ ඒවා සෑදීම සහ ඒවායේ තත්ත්වය පාලනය කිරීම | 01 | (xv) |
| 16 | පඩි සහ මිම් විධිමත් කිරීම | 01 | (xvi) |
| 17 | රා මැදීම සම්බන්ධ හදිසි අනතුරු වළක්වාලීම සහ කඹ හා ඒ කාර්යය සඳහා භාවිත කෙරෙන වෙනත් ආම්පන්න කලින්කල පරීක්ෂා කිරීම | 01 | (xvii) |
| 18 | දුනු තුවක්කු සහ මරුවැල් නිසා ඇතිවන හදිසි අනතුරු වළක්වාලීම | 01 | (xviii) |
| 19 | ළිං සහ වලවල් වටා වැටවල් බැඳීම | 01 | (xix) |
| 20 | සූදු සෙල්ලම් කිරීම සහ කුකුළන් පොර කෙටවීම සහ පොදු පටු පාරවල්වල සහ පාරවල්වල කරත්ත තරගයට දිවීම වළක්වාලීම | 02 | (xx) |
| 21 | පොදු මංමාවත්වල හෝ පාරවල්වල හෝ ප්‍රසිද්ධ ස්ථානවල අවිනීත ලෙස හැසිරීම, නිකරුනේ ගැවසීම සහ අසභ්‍ය වචන භාවිත කිරීම වළක්වාලීම | 01 | (xxi) |
| 22 | කවරාකාරයක හෝ ස්ප්‍රීතු හෝ වෙනත් මත්වන සුළු මත්පැන් හෝ යම් තාල වර්ගයේ වෘක්ෂ ප්‍රභේදයකින් ලබාගන්නා ලද රා හෝ මත් බවට හැරවූ උක්දඬු යුෂ වයස අවුරුදු දහසයකට අඩු පිරිමි ළමයින්ට හෝ ස්ත්‍රීන්ට විකිණීම වළක්වාලීම | 01 | (xxii) |
| 23 | කොණ්ඩා කපන ස්ථාන සහ බාබර් සාප්පු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම | 01 | (xxiii) |
| 24 | බිලියඩ් ක්‍රීඩාගාර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම | 01 | (xxiv) |

නීතිපති දෙපාර්තමේන්තුව
சட்ட மா அதிபதி திணைக்களம்
ATTORNEY GENERAL'S DEPARTMENT

**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත**
**ප්‍රධාන ලේකම් කාර්යාලය**
**ඩබ්.එච්. දහනායක මාවත,**
**ගාල්ල.**

**ඉඩම් කට්ටිකිරීම සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම**

ඔබේ 2001.06.28 ලිපිය හා බැඳේ

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය ප්‍රාදේශීය සභාවට ඇත.

මේ පනතේ 126 වගන්තිය ප්‍රාදේශීය සභා විසින් පැනවිය හැකි අතුරු ව්‍යවස්ථා හා සම්බන්ධ විෂයන් අඩංගු කර ඇත. 126 (VI) වගන්තිය ඉඩම් හා දේපල සම්බන්ධයෙන් පැනවිය හැකි අතුරු ව්‍යවස්ථා ඇතුලත් කර ඇත.

ඉඩම් කට්ටි කිරීම පිළිබඳව එකී වගන්තියේ ඇතුලත් කර නොතිබුනත්, ඒ හා සම්බන්ධ අතුරු ව්‍යවස්ථා පැනවීමට 122 (1) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවකට කළ හැකිය.

කෙසේ වුවද, එකී අතුරු ව්‍යවස්ථා 123 හා 125 වෙනි වගන්තිවලට යටත් වන අතර, 125 වෙනි වගන්තිය යටතේ පාර්ලිමේන්තුව මඟින් එම අතුරු ව්‍යවස්ථාවට අවසර නොදීමටත්, පරිච්ඡින්න හෝ සංශෝධනය කිරීමටත් බලය ඇත.

රජයේ අධිනීතිඥ
අත්සන සන්ධ්‍යා හෙට්ටිගේ
නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්,
නීතිපති වෙනුවට,

අතුරු ව්‍යවස්තා සම්පාදනය කිරීම සම්බන්ධව දකුණු පළාත් සභාව කරන ලද විමසීමකදී නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද පිළිතුරෙහි පිටපතකි

**25)** වීදුරු කැඩපත් නිපදවීම

**26)** යකඩ තහඩු ගැල්වනයිස් කිරීම

**27)** පාස්සන ඊයම් නිපදවීම

**28)** ඇළුමිනියම් භාන්ඩ නිපදවීම

**29)** කටුකම්බි නිපදවීම

**30)** කම්බි ඇණ නිපදවීම

**31)** කාබන් කඩදාසි හෝ යතුරු ලියන රිබන් නිපදවීම

**32)** බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබන් ටැංකි නිපදවීම

**33)** ජී.අයි. බාල්දි නිපදවීම

**34)** වායු සමීකරණ යන්ත්‍ර ශිතකරන හෝ අධි ශීතකරන නිපදිවීම හෝ අලුත් වැඩියා කිරීම

**35)** බ්රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම

**36)** යන්ත්‍රෝපකරන නිපදවීම

**37)** විදුලි භාණ්ඩ නිපදවීම

**38)** රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම

**39)** සංචායත බැටරි නිපදවීම

**40)** ට්‍රැක්ටර් රථ එකලස් කිරීම

**41)** රේඩියේටර් නිපදිවීම

**42)** ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියාව

**43)** වියලි කෝෂ බැටරි නිපදවීම

08. කරනු ලබන සැරසිලි කිසියම් පුද්ගලයෙකුට පුද්ගල කණ්ඩායමකට සෘජුව හෝ වක්‍රව අපහාස වන අයුරින් නොවිය යුතුය.

09. පහත සදහන් කරුණු ගැන එනම්,
   (1) නිකුත් කරනු ලබන අවසර පත්‍රය මෙම අතුරු ව්‍යවස්ථා වල සදහන් යම් විධිවිධානයක් කඩ කිරීම සදහා යොදා ගනු නොලබන බවට .
   (2) අවසර පත්‍රය මගින් අවසර ලැබුන ක්‍රියා නිසා මිනිසාට හෝ පරිසරයට හෝ පොදු දේපල වලට අලාභ හෝ හානි හෝ යම් උපද්‍රවයක් හෝ සිදු නොවන බවට හා
   (3) පරිසරය ආරක්ෂා කිරීම සදහා ඉල්ලුම්කරු විසින් ප්‍රමාණවත් පියවර ගෙන ඇති බවට,
   සෑහීමකට පත්වුවහොත් පමණක් අදාල අවසර පත්‍රය නිකුත් කල යුතුය.

10. (1) බලපත්‍රයක් නිකුත් කිරීම සදහා ගාස්තු වශයෙන් සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් සම්මත කරගනු ලබන ගාස්තු ප්‍රමාණයක් අය කල හැකිය. එම ගාස්තු ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත්කල යුතුය.

   (2) අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවේ අවසර පත්‍රලාභියා කරනු ලබන සැරසිලි ප්‍රමාණය පදනම් කරගෙන තැන්පත් මුදලක් සභාවේ තැන්පත් කල යුතුය. එම තැන්පත් මුදල් සභාව විසින් කලින් කලට යෝජනා සම්මුතියක් මගින් තීරණය කළ හැකිය.

11. (1) අවසරපත්‍ර ලාභියා විසින් කරනු ලැබූ සැරසිලි නියමිත කාලය තුල ඉවත් කරනු නොලැබුවහොත් අදාල සැරසිලි සභාව විසින් ඉවත් කිරීමද ඒ සදහා සභාවට වැයවන මුදල ආවරණය කිරීම සදහා අවසර පත්‍රලාභියා විසින් තැන්පත් කල මුදල සභා අරමුදලට බැර කරනු ලැබීමද නීත්‍යානුකූල වන්නේය.

   (2) අවසරපත්‍රලාභියා විසින් නියමිත කාලය තුල සැරසිලි ඉවත් කරනු ලැබීමෙන් පසු හා තැන්පත් මුදල ආපසු ලබා ගැනීම සදහා මාස 06ක් ඇතුලත ඉල්ලීමක් ඉදිරිපත් නොවුනහොත් එකී තැන්පත් මුදල සභා ආදායමට බැරකල යුතුය.

12. අවසර පත්‍ර ලාභියා විසින් මාර්ග දෙපස ඉඩම්වල ඇති දේපලකට හෝ එම මංමාවත් වල ගමන් කරනු ලබන යම් පුද්ගලයෙකුට පුද්ගල කණ්ඩායමකට හෝ දේපලකට අවහිර වන හෝ හානිවන ආකාරයට සැරසිලි නොකල යුතු අතර එමගින් යම් හානියක් සිදු වුවහොත්, එම හානිය සම්බන්ධ වගකීම අවසර පත්‍රලාභියා විසින් දැරිය යුතුය.

13. සැරසිලි කිරීමේදී ඉවතලන සියළුම ද්‍රව්‍ය පරිසරයට හානි නොවන ආකාරයට බැහැර කරලීම අවසර පත්‍ර ලාභියාගේ වගකීමක් වන්නේය.

# XIX වන කොටස

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල අතුරු ව්‍යවස්ථා

1 මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලබයි.

2 ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථිවල මංමාවත් වල පොදු ස්ථාන සහ පෞද්ගලික පරිශ්‍ර තුල ජනිත වන ඝන අපද්‍රව්‍ය වර්ග කිරීම, ගබඩා කිරීම, බැහැර කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය කිරීම, හුවමාරු ස්ථාන මෙහෙයවීම හා නඩත්තු කිරීම හා එම කාර්යන්ට සම්බන්ධිත හෝ ආනුෂංගික කාර්යයන් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3 ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි සෑම පරිශ්‍රයක්ම අපද්‍රව්‍ය වලින් තොරව සනීපාරක්ෂකව හා ප්‍රිය මනාප ලෙස තබා ගැනීම එම පරිශ්‍රයෙහි පදිංචිකරුගේ යුතුකම වන්නේය.

4 ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි සෑම පරිශ්‍රයකම පදිංචිකරු පරිශ්‍රය තුල ජනිතවන අපද්‍රව්‍ය එකතු කිරීම, වර්ග කිරීම, රැස් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා බැහැර කිරීම මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලට අනුකූලව කල යුතු වන්නේය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුතු වන්නේය.

5 (i) සෑම පරිශ්‍රයකම පදිංචිකරු තම පරිශ්‍රය තුල ජනිත වන ඝන අපද්‍රව්‍ය දිනපතා හෝ අවශ්‍ය වන්නේ නම් එයට අඩු කාලාන්තරවලදී ඇමිදීමෙන් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් අනුව එකතු කිරීම කල යුතුය.

(ii) පදිංචිකරු බැහැර කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ එකතු කරන්නෙකුට බාර දෙන්නේ නම් සභාවේ අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩ සටහනට සහ තම ප්‍රදේශයේ ක්‍රියාත්මක වන කාල සටහනට අනුකූලවද, සභාව මගින් කලින්කලට නිකුත් කරනු ලබන ප්‍රසිද්ධ නිවේදන වලට සහ උපදෙස් වලට අනුකූලවද එසේ කළ යුතුය.

(iii) පදිංචිකරු පරිශ්‍රය තුල නේවාසිකයින්ගේ හෝ පරිශ්‍රය වෙත පැමිණෙන තැනැත්තන්ගේ හෝ අසල්වාසීන්ගේ සෞඛ්‍යයට හෝ සනීපාරක්ෂාවට තර්ජනයක් සිදුවන ආකාරයට හෝ පීඩාවක් සිදුවන ආකාරයට අපද්‍රව්‍ය රැස් කිරීම හෝ ගබඩා කිරීම හෝ බැහැර කිරීම නොකල යුතුය.

6 (i) කිසිම තැනැත්තෙක් වීථියක්, පොදු හෝ පෞද්ගලික පාරක්, මංමාවතක් පටුමගක්, එළිමහන් ස්ථානයක් හෝ වෙනත් පොදු ස්ථානයක් හෝ පරිශ්‍රයක් වන හෝ පොදු හෝ පෞද්ගලික

# XX වන කොටස

## පෞද්ගලික ඉඩම් කටු පඳුරුවලින් තොරව පවත්වා ගැනීම, විධිමත් කිරීම, හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

01. මෙම අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඇති පෞද්ගලික ඉඩම් කටු පඳුරුවලින් තොරව පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්නා සියලුම ඉඩම් කටුපඳුරුවලින් තොරව පවත්වාගෙන යාම එකී ඉඩම්වල අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ කාර්යය විය යුතු ය.

03. කිසියම් ඉඩමක් කටුපඳුරුවලින් යුක්ත වන්නේද යන්න තහවුරු කර ගැනීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය වන අවස්ථාවක ඔහු විසින් පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර කාලයේ දී එකී ඉඩමට ඇතුල්වී පරීක්ෂා කිරීම නිත්‍යනුකූල වන්නේ ය. එවැනි කිසියම් පරීක්ෂා කිරීමකට කවර හෝ තැනැත්තෙකු විසින් බාධා නොකළ යුතු ය.

04. කිසියම් ඉඩමක් කටුපඳුරුවලින් යුක්ත වන බවට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා සෑහීමට පත්වී ඇති කවර හෝ අවස්ථාවක දී එකී ඉඩම කටුපඳුරුවලින් තොරව තබාගන්නා ලෙසට එකී ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුට ලිඛිතව දැන්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

05. 04 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ කිසියම් දැන්වීමක් ලැබුණු කවර හෝ තැනැත්තෙකු එකී දැන්වීමේ දින සිට දින දහ හතරක් ගතවීමට මත්තෙන් එකී ඉඩමේ කටුපඳුරු ඉවත්කිරීම කළ යුතු ය. කෙසේ වුව ද අයිතිකරු හෝ පදිංචිකරු විසින් පිළිගතහැකි හේතු ඉදිරිපත් කෙරෙන ලිඛිත ඉල්ලීමක් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක එකී කාර්යය සඳහා නියම කරන ලද කාලය ඉහත කී දැන්වීමේ දින සිට දින 30 ක උපරිමයකට යටත්ව දීර්ඝ කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් කරනු ලැබිය හැකි ය.

06. කිසියම් ඉඩමකින් ඉවත් කරනු ලැබූ කටුපඳුරු හෝ කටුපඳුරුවල කොටස් පොදු ස්ථානයකට හෝ මාර්ගයකට දැමීම නොකළ යුතු අතර වෙනත් යම් තැනැත්තකුට අයත් ඉඩමකට එකී තැනැත්තාගේ අවසරයකින් තොරව දැමීම ද නොකළ යුතු ය.

07. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ අතුරු ව්‍යවස්ථාවක දැක්වෙන නියමයන් හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් විය යුතු ය. එකී කිසියම් වරදක් සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය.එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තකු විසින් එකී කඩ කිරීම

හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

08. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ අතුරු ව්‍යවස්ථාවල -

''අයිතිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල ඇති කිසියම් ඉඩමක නිත්‍යානුකූල අයිතිකරු හෝ ඒ ඉඩමේ පදිංචි යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් අදහස් වන අතර රජයට අයත් යම් ඉඩමක්, ගිවිසුමක් යටතේ බද්දට හෝ කුලියට ගෙන සිටින යම් තැනැත්තෙකු ද ඇතුලත් විය යුතු අතර යම් පෞද්ගලික ඉඩමක් බද්දට හෝ කුලියට ගෙන ඇති තැනැත්තකු ද ඇතුළත් විය යුතු ය.

''කටුපඳුරු'' යන්නෙන්, කිසියම් තැනැත්තෙකුගේ පාලනයකින් තොරව පොළොව මට්ටමෙන් සෙන්ටිමීටර් 20 කට වඩා උසින් යුතුව ඉබේ වැවෙන කිසියම් ශාකයක් හෝ ශාක වර්ගයක් අදහස් වන අතර අලංකාරය පිණිස වවනු ලබන කිසියම් මල් පඳුරක් හෝ ආර්ථික හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා වවනු ලබන හෝ ඉබේ වැවෙන කිසියම් ශාකයක් හෝ භෝග වර්ගයක් ඇතුලත් නොවිය යුතු ය.

''පොදු ස්ථානය'' යන්නෙන් කිසියම් මාර්ගයක්, මංමාවතක්, වීථියක්, පටු මගක් දෙවැටක්, පදික වේදිකාවක්, පොදු ඉඩමක් මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිට්ටනියක්, පොදු ගොඩනැගිලක්, පොදු සුසානභූමියක්, බස්නැවතුම්පොලක්, දුම්රිය ස්ථානයක්, ඇලක්, දොලක්, වැවක්, පොකුණක්, කලපුවක් දිය කඩිත්තක්, දිය පහරක්, වැසි ජල කාණුවක්,මුහුදුවෙරළක්, සභාව සතු යම් ඉඩමක්, මහජනයාගේ පරිහරණය සඳහා වෙන් කර ඇති රජය සතු යම් ඉඩමක් හෝ මහජනයාගේ පොදු පරිහරනයට වෙන්කල වෙනත් ඕනෑම ස්ථානයක් අදාල වන්නේ ය.

''බලයලත් තැනැත්තා'' යන්නෙන් තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ නිලධාරියකු ද, ''සභාව'' යන්නෙන්, අදාළ ප්‍රාදේශීය සභාව ද, අදහස් විය යුතු ය.